## පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183 වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලැබූ පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## பாராளுமன்றத்தின் எதிர்க்கட்சித் தலைவர் அலுவலகம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்ட பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் 183 அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை 119(4) இன் பிரகாரம் கௌரவ அமைச்சர் அவர்களின் அவதானிப்புகள் மற்றும் மேற்கொண்ட நடவடிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

## Office of the Leader of the Opposition of Parliament

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports of Parliamentary Series No. 183 tabled by the Committee on Public Accounts in terms of the Standing Order No. 119 (4).

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

ආයතනයේ නම : පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය

| අනු අංකය | 2020 මුදල් වර්ෂය සඳහා කමිටුව මගින් හඳුනාගනු ලැබූ දුර්වලතා | පෙන්වා දී ඇති අඩු ලුහුඬුකම් නිවැරදි කිරීමට ආයතනය මගින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි | මේ වන විට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනු ලබයි. |
| 02. | මාසික මුදල් අවශ්‍යතා දැක්වෙන මුදල් ප්‍රවාහ සැලසුම් වර්ෂය ආරම්භයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට නිසි පරිදි මුදල් ප්‍රවාහ සැලැසුම් පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි. |
| 03. | 2016-03-31 දිනැති අංක 05/2016 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නැත. | මේ වන විට මෙම වාර්තා යැවීම යාවත්කාලීනව සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 04. | 2016-12-29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව විශේෂිත වියදම් ඒකකය සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරික්ෂාවන් කර නොතිබුණි. | වාහන කිහිපයක පරික්ෂාවන් සිදු කර අවසන් අතර, QR කේත ක්‍රමය හා ඉන්ධන ගැටළුව අවසන් වූ පසු අනෙකුත් වාහන සඳහා ද අදාළ පරික්ෂාවන් සිදු කරනු ලැබේ. |
| 05. | 2002-09-12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නැත. | මේ වන විට මෙම වාර්තා යැවීම යාවත්කාලීනව සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 06. | ආයතන පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 මගින් ප්‍රාග්ධන වියදම් සීමා කිරීම. |
| 07. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට වාර්ෂිකව මානව සම්පත් සැලසුම පිළියෙල කරනු ලබයි. |

| | | |
|---|---|---|
| 08. | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුනුවක් නියම කර නොතිබුණි. | මේ වන විට පවත්නා පුහුණු වැය විෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය හා පුහුණු අවශ්‍යතා ප්‍රමුඛතාගතකොට ලබා දෙන අක්මුදල් ප්‍රමාණය අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. |
| 09. | සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | කාර්යාලයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදුවන බැවින් එයින් පසු නව රාජකාරි පැවැරීමෙන් පසුව කාර්ය සාධන ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි. |
| 10. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවැතුණි. | මේ වන විට පවත්නා පුහුණු වැය විෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය හා පුහුණු අවශ්‍යතා ප්‍රමුඛතාගතකොට ලබා දෙන අක්මුදල් ප්‍රමාණය අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. |

සජිත් ප්‍රේමදාස, පා.ම.
විපක්ෂ නායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

2023-04-[illegible]